# මෙතැම්පිටමින් (අයිස්) භාවිතය ආශ්‍රිත ප්‍රවණතා පිළිබඳ සමීක්ෂණය 2020

පර්යේෂණ අංශය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

**ප්‍රධාන පර්යේෂණ කණ්ඩායම**

හඳානි සේනානායක

තමර දර්ශන

සුපුන් සේනානායක

තුෂාරි වලස්මුල්ලගේ

**සහය පර්යේෂණ කණ්ඩායම**

අසංකා මධුහංසි ගනේගම

ජී. හංසිකා කේතුමාලි

වසන්ත ප්‍රදීප් කුමාර

අර්ජුන රණසිංහ

# සංක්ෂිප්තය


මත්ද්‍රව්‍ය භාවිතය හා එහි ව්‍යාප්තිය පිළිබඳව අවධානය යොමු කිරීමේදී වැඩි වශයෙන් ගංජා, හෙරොයින් සම්බන්ධව සාකච්ඡාවට බඳුන් වෙමින් පවතී. එසේ වුවත් වර්තමානය තුළ ශාබ මත පදනම් නොවූ කෘත්‍රිමව නිපදවන මනෝවර්තක ගණයේ ඖෂධ කෙරෙහි පුද්ගලයින් යොමුවීමේ සැලකිය යුතු ප්‍රවණතාවයක් පවතින බව සංඛ්‍යාත්මක තොරතුරු මඟින් තහවුරු වී ඇත. ඒ අතරින් මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගලයින්ගේ ප්‍රජා සමාජ විද්‍යාත්මක පැතිකඩ හා චර්යාත්මක ලක්‍ෂණ පිළිබඳ හඳුනා ගැනීමට මෙම සමීක්ෂණය මූලික වශයෙන් සිදුකර ඇත. මෙහි පර්යේෂණ ක්‍රමවේදය ලෙස මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය භාවිත කර ඇත. දත්ත රැස් කිරීමේදී සසම්භාවී නොවන නියැදි ක්‍රමයක් වන හිමබෝල නියැදීම් ක්‍රමය අනුව මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගලයින් 50 දෙනෙකු සමීක්ෂණ නියැදිය සඳහා ඇතුළත් කරගෙන ඇත. මෙතැම්පිටමින් සඳහා ඇති ඇබ්බැහිකාරීත්වය මිනුම් කිරීම සඳහා APA අනාවරණ පරීක්ෂාව යොදාගෙන ඇත.

සමීක්ෂණයේ ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමේ දී මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගලයන් මෙතැම්පිටමින් වලට අමතරව හෙරොයින්, ඖෂධමය පෙති වර්ග අනිසි භාවිතය, ගංජා, මධ්‍යසාර, සිගරැට්, ඇම්පිටමීන් බාණ්ඩයේ උත්තේජක, මත්ද්‍රව්‍යය ලෙස භාවිත කර ඇත. පුද්ගලයින් සාමාන්‍යයෙන් වයස අවුරුදු 19 දී ප්‍රථම වරට මෙතැම්පිටමින් භාවිතයට යොමුවී ඇති අතර මෙතැම්පිටමින් භාවිත කිරීමේ දී 72% ක බහුතරයක් චයිනීස් ක්‍රමයෙන් ද ඇතැම්විට ඉතා සුළු පිරිසක් එන්නත් කර ගැනීමක් ද දැකිය හැකිය. මෙතැම්පිටමීන් භාවිතය කෙරෙහි 92% ක බහුතරයක් මිතුරු කණ්ඩායම් මඟින් යොමු වී ඇත. මෙතැම්පිටමින් භාවිතය වයස 19 -26 වයස් කාණ්ඩයේ තරුණ පිරිස් අතර ඉහළ ප්‍රවණතාවක් දැකිය හැක. ඔවුන් මෙතැම්පිටමින් ලබා ගැනීම, අලෙවි කිරීම ආදී කටයුතු සඳහා සමාජ මාධ්‍ය සහ වෙබ් අඩවි ද භාවිතා කර ඇත. මෙතැම්පිටමින් භාවිතා කළ පුද්ගලයින් කෙටිකාලීනව ශාරීරික හා මානසික වශයෙන් මුහුණදුන් වෙනස්කම් අතර බහුතරයකට නින්ද නොයාම දැක්විය හැකිය. තවද ආහාර අරුචිය, දත්මිටි කෑම, දත් එකට එක එකමත තදවීම , ශරීර උෂ්ණත්වය ඉහළ යාම ආදිය දැක්විය හැකිය. දිගුකාලීන වෙනස්කම් සැලකීමේ දී ශරීරය කෙට්ටු වීම, අමතක වීම්, මානසික විකෘතිභාවය හා ප්‍රචණ්ඩකාරී ස්වභාවයන් ඇතිවීම, දත් දිරායාම, භ්‍රාන්තිකාරක හැඟීම් ඇති වීම හා පපුවේ වේදනාව ආදිය දැක්විය හැකිය. නියැදියෙහි පුද්ගලයන්ගෙන් 34% ක් දිනපතා මෙතැම්පිටමින් භාවිත කරනු ලබයි. මෙතැම්පිටමින් භාවිතා කළ පුද්ගලයෙක් සාමාන්‍යයෙන් දිනකට වාර 4ක් භාවිතා කරන අතර ඒ සඳහා දිනකට සාමාන්‍යයෙන් පැකට් 2ක් භාවිතා කරනු ලබයි. මේ සඳහා පුද්ගලයෙකුට සාමාන්‍යයෙන් දිනකට රුපියල් 3000ක මුදලක් වැය වේ. මෙතැම්පිටමින් පැකට්ටුවක වීවී මට්ටමේ සාමාන්‍ය මිල රුපියල් 2500 වන අතර පැකට්ටුවක අන්තර්ගත සාමාන්‍ය මෙතැම්පිටමින් ප්‍රමාණය 300mg ක් වේ. තවද සමීක්ෂණ තොරතුරු වලට අනුව මෙතැම්පිටමින් 1g ක වීවී මට්ටමේ සාමාන්‍ය මිල රුපියල් 10,000 ක් බව අනාවරණය විය. මෙතැම්පිටමින් සමඟ අනෙකුත් මත්ද්‍රව්‍ය එකක් හෝ කිහිපයක් භාවිතා කිරීමේ ප්‍රවණතාවයක් ද හඳුනාගත් අතර බහුලව මෙතැම්පිටමින් භාවිතා කරන පුද්ගලයින් මෙතැම්පිටමින් නොමැති අවස්ථා වලදී විකල්ප මත්ද්‍රව්‍ය ලෙස හෙරොයින්, පෙති වර්ග, කොකේන් හා LSD භාවිතා කර ඇත.

මෙතැම්පිටමින් භාවිතය සම්බන්ධ අනාවරණ පරීක්ෂාව (Screening Test) තුළින් පුද්ගලයින් 64% ක් ඉහළ ඇබ්බිහිකාරී තත්ත්වයන් පෙන්නුම් කළ අතර මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයන්ගෙන් අති බහුතරයකට තමාව පාලනය කර ගැනීමට නොහැකිවීම, මෙතැම්පිටමීන් සම්බන්ධ අවශ්‍යතාවය ක්‍රමයෙන් වැඩිවීම හා ඒ සම්බන්ධව අවධානය යොමුකිරීමට සිදුවීම මඟින් ඔවුන්ගේ ඇබ්බැහිකාරීත්වය ඉහළ බැව් අවධාරණය විය. තවද විරමණ ලක්ෂණ වලට මුහුණ දීම, සමාජ සම්බන්ධතා බිඳ වැටීම හා ඔවුන්ට ඇඩිව සෞඛ්‍ය ගැටළු වලට මුහුණ දීමට සිදුවී ඇත. මෙතැම්පිටමින් සම්බන්ධයෙන් ප්‍රතිකාර සඳහා යොමු වීම් සලකා බැලීමේ දී 20% ක් පමණ ප්‍රතිකාර සඳහා යොමු වී ඇති අතර, 90%ක් ප්‍රතිකාර සඳහා යොමු වීමට ඉහළ කැමැත්තකින් පසුවෙති.

# 01. හැඳින්වීම

මෙතැම්පිටමින් (Methamphetamine) උත්තේජක කාණ්ඩයට අයත් ප්‍රබල ඇබ්බැහිකාරී මත්ද්‍රව්‍යයක් ලෙස හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාව තුළ මෙතැම්පිටමින් "අයිස් (Ice)" යන වීථි නාමයෙන් හඳුන්වනු ලබන  අතර ප්‍රධාන වශයෙන් දුම්පානය මගින්, ආඝ්‍රාණය මගින් හෝ එන්නත් වශයෙන් ශරීරගත කර ගනු ලබයි. පසුගිය වසර 03 කට අදාළව මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් වලට අදාළ සංඛ්‍යාලේඛන විශ්ලේෂණය කිරීමේදී මෙතැම්පිටමින් භාවිතය ක්‍රමිකව වර්ධනය වී ඇති බව තහවුරු වෙයි. එමෙන්ම මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් ආශ්‍රයෙන් කරනු ලබන සමීක්ෂණ/පර්යේෂණ අධ්‍යයන මගින් ද තහවුරු වන ආකාරයට මෙතැම්පිටමින් භාවිතයේ ප්‍රවණතාවක් නිර්මාණය වෙමින් පවතින බවට සාධක අනාවරණය වී ඇත. ශ්‍රී ලංකාවේ මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගලයින්ගේ භාවිත රටා, මත්ද්‍රව්‍ය භාවිතයේ පැතිකඩ, ඒ හා සම්බන්ධ චර්යාවන්, ආකල්ප හා සමාජ නිර්මිත (Drug use patterns, profile, behaviour, attitude and social constructions) ආදිය සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කර ගැනීම සඳහා මෙම සමීක්ෂණය ක්‍රියාත්මක විය.

## 1.1 පසුබිම

මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට ගැනීම් පිළිබඳ පසුගිය වසර 04 කට අදාළ සංඛ්‍යාලේඛන විශ්ලේෂණය කිරීමේදී හෙරොයින්, ගංජා සහ කොකේන් වැනි මත්ද්‍රව්‍ය සම්බන්ධව අත්අඩංගුවට පත්වීම් ක්‍රමානුකූලව වැඩි වී ඇත. එමෙන්ම මෙතම්පිටමින් සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් 2017 වර්ෂයේ සිට ක්‍රමිකව වර්ධනය වී ඇත.

**වගු අංක 01-මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට පත්වීම්. 2017-2020**

| වර්ෂය | ගංජා | හෙරොයින් | කොකේන් | මෙතම්පිටමින් |
|---|---|---|---|---|
| 2017 | 51,788 | 29288 | 29 | 06 |
| 2018 | 54,686 | 40998 | 21 | 257 |
| 2019 | 45,923 | 40,970 | 184 | 2,073 |
| 2020 | 40,732 | 50,334 | 31 | 2,375 |

මූලාශ්‍රය- මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත 2019/ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ වාර්ෂික දත්ත 2020

ඉහත සංඛ්‍යාලේඛන විශ්ලේෂණය කිරීමේදී හඳුනාගත හැකි ප්‍රධාන සහ අවධානය යොමු කළ යුතු ප්‍රවණතාවක් ලෙස මෙතැම්පිටමින් සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්වීම් වර්ධනය වීම හඳුනාගත හැකිය. 2017 සිට 2019 වර්ෂය දක්වා මෙතැම්පිටමින් සම්බන්ධ අත්අඩංගුවට පත්වීම් පුද්ගලයින් 06 දෙනෙකුගේ සිට 2073 දෙනෙක් දක්වා වර්ධනය වී ඇත. අත්අඩංගුවට පත්වූ මෙතැම්පිටමින් මත්ද්‍රව්‍ය ප්‍රමාණය පිළිබඳ අවධානය යොමු කිරීමේදී 2016 වර්ෂයේදී සිද්ධීන් දෙකක් සඳහා 50g ක්, 2017 වර්ෂයේ වාර්තා වූ සිද්ධීන් 05 ක් සඳහා ග්‍රෑම් 96 ක් සහ මිලි ග්‍රෑම් 550 ක් සහ 2018 වර්ෂයේ අත්අඩංගුවට පත් සිද්ධීන් 254 ක් සඳහා කිලෝ 7 ක් සහ  ග්‍රෑම් 127 ක් අත්අඩංගුවට පත්ව ඇත.

ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත හෙරොයින් භාවිත කරන පුද්ගලයින් 92,540 ක් වන අතර එය අවුරුදු 14 ට වැඩි ජනගහනයෙන් 0.6% ක ප්‍රතිශතයකි. ඇස්තමේන්තුගත ගංජා භාවිත කරන පුද්ගල සංඛ්‍යාව 301, 898 ක් වන අතර වයස අවුරුදු 14 ට වැඩි ජනගහනයට ප්‍රතිශතයක් වශයෙන් 1.9% කි. එමෙන්ම 24,211 ක් ඖෂධමය පෙති වර්ග අවභාවිත කරනු ලබයි. මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය පිළිබඳ ජාතික සමීක්ෂණය 2019 ට අනුව හෙරොයින්, ගංජා සහ ඖෂධමය පෙති වර්ග භාවිතයේ ව්‍යාප්තිය සහ ප්‍රවණතාව ඇස්තමේන්තු ගත කර ඇත. ඒ අනුව පළාත් සහ දිස්ත්‍රික්ක මට්ටමින් මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය පිළිබඳ ප්‍රමාණාත්මක විශ්ලේෂණයක් සිදුකර ඇත.

ජාතික සමීක්ෂණය තුළ ප්‍රධාන වශයෙන් ගංජා, හෙරොයින් සහ ඖෂධමය පෙති වර්ග අවභාවිතය සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇත. ඊට අමතරව පුද්ගලයින් භාවිත කරනු ලබන වෙනත් මත්ද්‍රව්‍ය වර්ග සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් දත්ත රැස් කිරීමද සිදු කර ඇති අතර එහිදී මෙතැම්පිටමින් භාවිතා කරන පුද්ගලයින් 1460 දෙනෙක් සම්බන්ධයෙන් දත්ත වාර්තා වී ඇත. ඒ අතරින් බහුතර පුද්ගලයින් සංඛ්‍යාවක් කොළඹ දිස්ත්‍රික්කයෙන් හා ගම්පහ දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. ඊට අමතරව පුත්තලම, රත්නපුර සහ ගාල්ල දිස්ත්‍රික්ක වලින් ද මෙතැම්පිටමින් භාවිතා කරන පුද්ගලයින් සම්බන්ධයෙන් තොරතුරු වාර්තා වී ඇත. මෙහිදී මෙතැම්පිටමින් භාවිත කරනු ලබන පුද්ගලයින්ගේ ව්‍යාප්තිය පිළිබඳ සංඛ්‍යාත්මක විශ්ලේෂණයක් පමණක් සිදු කර ඇති නමුත් භාවිතා කරන පුද්ගලයින්ගේ පැතිකඩ සහ භාවිත රටාවන් සම්බන්ධයෙන් අධ්‍යයනයක්/ තක්සේරුවක් සිදු කර නොමැත.

## 1.2 ගැටලුව

අත්අඩංගුවට පත්වීම් පිළිබඳ දත්ත මගින් මෙතැම්පිටමින් භාවිතයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් සහ සංඛ්‍යාත්මකව භාවිතා කරන පුද්ගලයින්ගේ වර්ධනයක් සිදුවෙමින් පවතින බව අනාවරණය වී ඇත. නමුත් භාවිතා කරන පුද්ගලයින්ගේ පැතිකඩ, භාවිත රටාවන්, භාවිතය හා සම්බන්ධ සුවිශේෂී චර්යාවන් සහ භාවිතා කරන පුද්ගලයින්ගේ සබඳතා ජාලය පිළිබඳව තොරතුරු වල ඌණතාවයක් පැවතිණි. මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගලයින් සඳහා නිවාරණය, ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අදාළ පුද්ගල කණ්ඩායම්වල පැතිකඩ සම්බන්ධයෙන් දත්ත නොමැතිවීම ද ගැටලුවක් ලෙස හඳුනාගැනීමට හැකිවිය.

## 1.3 අරමුණු

- මෙතැම්පිටමින් භාවිතා කරන පුද්ගලයින්ගේ භාවිත ප්‍රවණතාවයන් හඳුනා ගැනීම.
- මෙතැම්පිටමින් භාවිතා කරන පුද්ගයින්ගේ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක පැතිකඩ අනාවරණය කර ගැනීම.
- මෙතැම්පිටමින් භාවිතයට යොමුවීම සම්බන්ධ හේතු සහ පුද්ගල චර්යාවන් හඳුනාගැනීම.
- මෙතැම්පිටමින් භාවිතය සමඟ පුද්ගලයින් අත්විඳින සෞඛ්‍ය අවදානම් තත්ත්ව හඳුනා ගැනීම.
- මෙතැම්පිටමින් භාවිතා කරන පුද්ගලයින් සඳහා ඉලක්කගත නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් සඳහා අවශ්‍ය නිර්දේශ සහ යෝජනා ඉදිරිපත් කිරීම.

## 1.4 පර්යේෂණ ප්‍රශ්න

ප්‍රධාන පර්යේෂණ ගැටලුව අධ්‍යයනය කිරීමේ දී මෙතැම්පිටමින් භාවිතය සම්බන්ධයෙන් පහත ප්‍රශ්න මූලික කරගනිමින් සමීක්ෂණය ක්‍රියාත්මක විය.

1. මෙතැම්පිටමින් භාවිතා කරන පුද්ගලයින්ගේ භාවිත රටාවන් වල ස්වභාවය කෙබඳුද?
2. ප්‍රජා විද්‍යාත්මක ලක්ෂණ අනුව මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගලයින්ගේ ව්‍යාප්තිය කෙබඳුද?
3. මෙතැම්පිටමින් භාවිතය හා සම්බන්ධ පුද්ගල හා සමාජ චර්යා රටාවන්වල ස්වරූපය කෙබඳුද?
4. ඉලක්ක ගත කණ්ඩායම මුහුණපාන සෞඛ්‍ය අවදානම් තත්ත්ව මොනවාද?

## 1.5 පර්යේෂණ ක්‍රමවේදය

මෙතැම්පිටමින් භාවිත රටාවන්, චර්යාවන් වැනි කරුණු සම්බන්ධයෙන් ගුණාත්මක දත්ත සහ ප්‍රජා විද්‍යාත්මක පැතිකඩ සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත ලබාගත් අතර ඒ සඳහා මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යොදාගෙන ඇත. එහිදී සමීක්ෂණ ක්‍රමය යටතේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම භාවිත කර ඇත. දත්ත එක්රැස් කිරීම සඳහා නියැදි සමීක්ෂණයක් භාවිත කර ඇත.

## 1.6 අධ්‍යයන ක්ෂේත්‍රය සහ නියැදුම් ක්‍රමවේදය හා නියැදිය

අධ්‍යයන ක්ෂේත්‍රය තෝරා ගැනීමේ දී මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය අනුව ඉහළ ව්‍යාප්තියක් සහිත කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කයන් ඇතුලුව අනෙකුත් දිස්ත්‍රික්කයන්ද අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස සලකන ලදී. නියැදියට දත්ත දායකයින් තෝරා ගැනීමේදී සම්භාවිතා නොවන නියැදි ක්‍රමය (Non Probability Sampling method) යටතේ හිමබෝල නියැදි ක්‍රමය (Snowballing Sampling method) භාවිත විය. මෙතැම්පිටමින් භාවිතා කරන පුද්ගලයින් සැඟවුණු කණ්ඩායම් වන බැවින් සහ මූලික තොරතුරු සපයන්නන්ට හා මෙතැම්පිටමින් භාවිතා කරන පුද්ගලයින් එකවර හඳුනා ගත නොහැකි නිසා හිමබෝල නියැදීම් ක්‍රමය මේ සඳහා වඩාත් යෝග්‍ය විය. එහිදී දැනට මෙතැම්පිටමින් භාවිත කිරීම, නියැදියට ඇතුළත් කර ගැනීමේ නිර්නායකයක් විය. ඒ අනුව සමීක්ෂණය තුළ මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගලයින් 50 දෙනෙකු නියැදියට ඇතුළත් කරගෙන ඇත.

## 1.7 දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම

මත්ද්‍රව්‍ය භාවිත රටාවන් සහ චර්යා රටාවන් පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කළ යුතු බැවින් සම්මුඛ සාකච්ඡා, ප්‍රත්‍යෙක අධ්‍යන සහ නිරීක්ෂණ ශිල්ප ක්‍රම දත්ත රැස් කිරීම සඳහා භාවිතා කර ඇත. ඊට අමතරව ප්‍රජා විද්‍යාත්මක සාධක සහ වෙනත් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතා විය. එහිදී පූර්ව අධ්‍යයනයක් හරහා වලංගුතාවය පරික්ෂා කරනු ලැබුණි. ඊට අමතරව මෙතැම්පිටමින් භාවිතා කරන පුද්ගලයන්ගේ ඇබ්බැහිකාරීත්වයේ මට්ටම මිනුම් කිරීම සඳහා APA අනාවරණ පරීක්ෂාව යොදාගෙන ඇත.

## 1.8 දත්ත සකස් කිරීම සහ විශ්ලේෂණය

සමීක්ෂණයට අදාළ දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රම හරහා විශ්ලේෂණය කළ අතර ඒ සඳහා SPSS හා Ecxel පරිගණක මෘදුකාංග භාවිත විය.

# 02. මෙතැම්පිටමින් භාවිතයේ ප්‍රවණතා හා ගෝලීය තත්ත්වය

## 2.1 මෙතැම්පිටමින් භාවිතය හා එහි ප්‍රවණතා

මෙතැම්පිටමින් යනු මධ්‍ය ස්නායු පද්ධතියට බලපෑම් ඇති කිරීමට සමත් අධික ලෙස ඇබ්බැහියක් ඇති කරන ප්‍රබල උත්තේජක ද්‍රව්‍යයක් වේ. මෙය බාහිර පෙනුමෙන් දිලිසෙන නිල් හා සුදු පැහැ පාෂාණ ආකාරයෙන් දැකිය හැකි වේ. මෙතැම්පිටමින් රසායනිකව ඇම්පිටමින් වලට සමාන වන අතර එය විසි වන සියවසේ මුල් භාගයේදී නිපදවා ඇත්තේ ඇම්පිටමින් පාදක ඖෂධ වශයෙන් යොදා ගනිමිනි. මෙතැම්පිටමින් සඳහා බිලූ, මෙතැම්පිටමින්, මෙත්, ස්පීඩ් යන නම් වීථි මට්ටම තුළ භාවිතා කරනු ලබයි.

රූපය 1 - මෙතම්පිටමින් වල බාහිර පෙනුමේ ස්වභාවය




මූලාශ්‍රය: (https://www.drugabuse.gov/publications/research-reports/methamphetamine/what- methamphetamine)

රූපය 2 - මෙතම්පිටමින් වල රසායනික ව්‍යුහය




මූලාශ්‍රය : (https://www.emcdda.europa.eu/publications/drugprofiles/methamphetamine_en)

මෙතැම්පිටමින් ශරීරගත කරන ආකාරයන් කිහිපයකි.

- දුම් පානයෙන් (Smoking)
- නාසයෙන් අඝ්‍රාණය කිරීමෙන් (Snorting)
- කුඩක් ලෙස පවතින ද්‍රව්‍ය ජලයේ හෝ ඇල්කොහොල් වල මිශ්‍ර කර එන්නත් කිරීමෙන් (Injecting)

මෙතැම්පිටමින් භාවිතා කිරීමෙන් පසුව ඉන් ලැබෙන ඉහළ උත්තේජනය ආරම්භ වී ඉක්මනින් පහළ බසින බැවින් නැවත නැවතත් මෙතැම්පිටමින් මාත්‍රාවන් ලබා ගැනීමට පුද්ගලයන් පෙළඹීම සිදු වේ. මේ තත්ත්වය මත සමහර අවස්ථාවලදී පුද්ගලයින් විසින් සෑම පැය කිහිපයකට වරක්ම නින්ද හෝ ආහාර ගැනීම පවා මගහරිමින් දින ගණනක් වුවද භාවිතයට යොමු වේ.

මෙතැම්පිටමින් ශරීරයට සිදු කරන බලපෑම සලකා බැලීමේදී එමගින් මොළයේ සාමාන්‍ය ඩොපමින් රසායනිකය නිදහස් කිරීමේ ප්‍රමාණය වැඩි කරයි. ඩෝපමින් රසායනිකය ශරීරයේ චලනය අභිප්‍රේරණය සහ ශරීරය ශක්තිමත් කිරීමට දායක වේ. මෙතැම්පිටමින් මගින් මොළයේ ඉහළ කොටස කරා ඩෝපමින් වේගයෙන් ශ්‍රාවය කිරීමේ හැකියාව ලැබෙන අතර එමගින් මත්ද්‍රව්‍ය ගැනීමේ හැසිරීම තවදුරටත් ශක්තිමත් කරන අතර භාවිතා කරන්නාට එම අද්දැකීම නැවත නැවත ලැබීමට කැමැත්ත ඇති කරවයි (NIDA,2019,Mayhttps://d14rmgtrwzf5a.cloudfront.net/sites/default/files/drugfacts-methamphetamine.pdf).

## 2.2 මෙතම්පිටමින් භාවිතයේ කෙටිකාලීන හා දිගුකාලීන බලපෑම්

මෙතැම්පිටමින් භාවිතයෙහි කෙටි කාලීන බලපෑම් වශයෙන් හඳුනා ගත හැකි වන්නේ භාවිතයෙන් විනාඩි ගණනක් ඇතුළත දී ශරීරයෙහි සිදු වන වෙනස්කම් වේ. මෙතැම්පිටමින් ඉතා කුඩා ප්‍රමාණයක් ලබා ගැනීමෙන් වුවද කොකේන් හෝ ඇම්පිටමින් වැනි උත්තේජක වලට සමාන ශාරීරික ලක්ෂණ ඇති විය හැකිය. එමෙන්ම පහත ලක්ෂණයන් ද කෙටි කාලීන බලපෑම් වශයෙන් හඳුනා ගත හැකි වේ.

- ශරීරය අවදිව තැබීම හා ක්‍රියාකාරකම් සිදු කිරීමේ හැකියාව වැඩිවීම
- ආහාර රුචිය අඩු කිරීම
- හුස්ම ගැනීමේ වේගය වැඩි වීම
- වේගවත් හෝ අක්‍රමවත් හෘද ස්පන්දනය
- රුධිර පීඩනය වැඩි වීම
- ශරීරය උෂ්ණත්වය වැඩි වීම

මෙතැම්පිටමින් භාවිතයෙහි දීර්ඝකාලීන බලපෑම් වශයෙන් හඳුනා ගත හැකි වන්නේ කෙටි කාලීන බලපෑම් වලින් ඔබ්බට ගොස් දීර්ඝකාලීනව යථා තත්ත්වයට පත් නොවී පවතින දුබලතාවයන් ය. විශේෂයෙන්ම මෙතැම්පිටමින් එන්නත් කරන පුද්ගලයන්ට HIV/AIDS සහ හෙපටයිටීස් B,C සහ

ලිංගාශ්‍රිතව බෝවන රෝග ඇතිවීමේ අවදානම වැඩි වේ. මෙම රෝග සම්ප්‍රේෂණය වන්නේ මත්ද්‍රව්‍ය භාවිතයට ගන්නා උපකරණ මත රැඳි රුධිරය හෝ වෙනත් ශාරීරික තරල මගිනි. මෙතැම්පිටමින් භාවිතයෙන් අනාරක්ෂිත ලිංගික හැසිරීම් වැනි අවදානම් සහගත හැසිරීම් වලට තුඩු දෙන තීරණ ගැනීමේ වෙනස්කම් සිදු කළ හැකි අතර එයින් රෝග ආසාදනය වීමේ හැකියාව වැඩි වේ. එසේම HIV/AIDS වැනි රෝගවල ව්‍යාප්තිය හා රෝග ලක්ෂණ වැඩි වීමට ද ඉඩකඩ පවතී. තවද සිතීම, අවබෝධ කර ගැනීම, ඉගෙනීම සහ මතකය වැනි ප්‍රජානන දුර්වලතා ඇතිවීමේ සම්භාවිතාවය ද ඉහළ යයි. එමෙන්ම පහත දැක්වෙන ලක්ෂණයන් ද දීර්ඝකාලීන බලපෑම් වශයෙන් හඳුනා ගත හැකි වේ.

- ශරීර ස්කන්ධය ශීඝ්‍රයෙන් අඩුවීම
- ඇබ්බැහිය
- දරුණු ගණයේ දත් ආශ්‍රිත රෝග
- කැසීම් සීරීම් සහ සමේ තුවාල ඇති වීම වැනි අසාත්මිකතා
- මොලයේ ව්‍යුහය සහ ක්‍රියාකාරීත්වය දුර්වල වීම
- මානසික ව්‍යාකූලත්වය
- මතකය ගිලිහී යාම
- නින්ද ආශ්‍රිත ගැටලු
- දරුණු හැසිරීම්
- මානසික ආතතිය
- භ්‍රාන්තීන්

මීට අමතරව අඛණ්ඩ මෙතැම්පිටමින් භාවිතය මොළයේ රසායන වල වෙනස්වීම් වලට හේතු වන අතර මොළයේ චිත්තවේගයන්, මතකයේ දුර්වලතා සහ සංජානන ගැටලු ඇති විය හැකි බව අධ්‍යයන වලින් ඔප්පු කර තිබෙන බව National Institute on Drug Abuse; National Institutes of Health; U.S. Department of Health and Human Services, 'Methamphitamine Research Report' නම් වාර්තාව දක්වනු ලබයි. එම වාර්තාව තවදුරටත් සඳහන් කරන ආකාරයට ගර්භනී සමයේ මෙතැම්පිටමින් භාවිතය හේතුවෙන් කුස තුළ සිටින දරුවා ගබ්සා වීම, උපතේදී දරුවාගේ ශරීරය කුඩා වීම, උදාසීනත්වය, හෘදයේ සහ මොළයේ අසාමාන්‍යතා ඇති වීමට සම්භාවිතාවයක් පවතී. සමහර දුර්වලතාවයන් මෙතැම්පිටමින් නවතා වසරක් හෝ ඒ ආසන්න කාලයක් තුළ පහව ගිය ද සමහර දුර්වලතාවයන් එසේ යථා තත්ත්වයට පත් වීමට දීර්ඝ කාලයක් ගතවේ. මෙතැම්පිටමින් එක් වරක් හෝ භාවිතා කළ අයෙකුට පාකින්සන් වැනි ස්නායු ආශ්‍රිත රෝගී තත්ත්වයන් ඇතිවීමේ අවදානම ඉහළ යන බවට පර්යේෂණ වලින් හෙලිකර තිබේ.




මෙතැම්පිටමින් අධිමාත්‍රා වීමේ ද වැඩි ශක්‍යතාවයක් පවතී. පුද්ගලයෙකු අධික ලෙස මෙතැම්පිටමින් මත්ද්‍රව්‍යක් ලෙස භාවිතා කිරීමේදී විෂ සහිත ප්‍රතික්‍රියාවන් ඇති විය හැකි අතර අධික ලෙස හානිකර රෝග ලක්ෂණ ඇති වීමේ සිට මරණය පවා ඇති විය හැකිය. National Institute on Drug Abuse; National Institutes of Health; U.S. Department of Health and Human Services Drug Facts වාර්තාව සඳහන් කරන ආකාරයට 2017 වසරේදී ඇමරිකාව තුළ සියලුම ඖෂධ අධිමාත්‍රා වීම් වලින් 15%ක් පමණ මෙතැම්පිටමින් කාණ්ඩයට සම්බන්ධ අතර එම මරණ වලින් 50%ක් මාදක ඖෂධ අවභාවිතයේ ප්‍රතිඵල විය.

මෙතැම්පිටමින් දුම්පානයෙන් සහ එන්නත් කර ගැනීම හරහා ශරීරගත කර ගැනීමෙන් රුධිරයට හා මොලයට එම රසායනය ඉතා ඉක්මනින් ගමන් කිරීම සිදු වේ. නාසයෙන් ඉරීම මගින් විනාඩි 03 ත් 05 ත් අතර ශරීරයට ප්‍රතිඵල දනවන අතර මුඛ මාර්ගයෙන් ගැනීමෙන් මිනිත්තු 15 ත් 20 ත් අතර ප්‍රතිඵල ඇති කරවනු ලබයි. උත්තේජක ගනයේ මෙම මත්ද්‍රව්‍ය ශරීරගත වූ විට එහි බලපෑම ඉක්මනින් අවසන් වන නිසාවෙන් භාවිතා කරන්නන් ඉතා ඉක්මනින් නැවත නැවතත් මාත්‍රාවන් ලබා ගැනීමට පෙළඹෙනු දැකිය හැකිය. සමහර අවස්ථා වලදී ආහාර හා නින්ද පවා නොසලකා හරිමින් නොකඩවා දින ගණනක් වුව ද එසේ මෙතැම්පිටමින් භාවිත කිරීමට පෙළඹේ.

මෙතැම්පිටමින් අධි මාත්‍රා වූ විට නිරන්තරයෙන්ම ඇති වන පොදු රෝගී තත්ත්වයන් වනුයේ ආඝාතය, හෘදයාබාධ, ඉන්ද්‍රීය ගැටලු යනාදියයි. අධිමාත්‍රා වූවෙකුට පළමු ප්‍රතිචාරය දක්වන හදිසි අනතුරු අංශ වල සෞඛ්‍ය නිළධාරීන් මූලිකවම උත්සාහ දරනුයේ මොළයේ බලපෑමට ලක් වූ කොටස වෙත රුධිර ගමනාගමනය යථා තත්ත්වයට පත් කිරීම, හෘදයට රුධිර ගමනාගමනය යථා තත්ත්වයට පත් කිරීම, අවයව ගැටලු වලට ප්‍රතිකාර කිරීම යනාදිය සඳහාය (NIDA,2019,May,https://d14rmgtrwzf5a.cloudfront.net/sites/default/files/drugfacts-methamphetamine.pdf).

## 2.3 මෙතම්පිටමින් භාවිතය සදහා ප්‍රතිකාර හා එහි ඵලදායීබව

මෙතැම්පිටමින් යනු අධි ඇබ්බැහිකාරී මත්ද්‍රව්‍යක් වන නිසාම දීර්ඝකාලීන භාවිතයට පෙළඹුනු අයෙකු භාවිතය එක් වරම නවතා දැමූ විට කාංසාත්මක ස්වභාවයන්, තෙහෙට්ටුව, දැඩි මානසික අවපීඩනය, සයිකෝසියාව, මත්ද්‍රව්‍ය පිළිබඳ දැඩි ආසක්ත බව ඇතිවිය හැකිය. දැඩි ලෙස ඇබ්බැහියක් සහිත වූවෙකුට ප්‍රතිකාර කිරීම සඳහා අනුමත ඖෂධ නිශ්චිතව මේ වන විට දක්වා නොමැති අතර මෙතැම්පිටමින් භාවිතය නිවාරණය කිරීම සිදු කළ හැකි අතර ඇබ්බැහිකාරීත්වයෙන්

මුදවා ගැනීම සඳහා වඩාම ඵලදායී ප්‍රතිකාරය ලෙස හඳුනා ගන්නේ චර්යාත්මක ප්‍රතිකාර විධි ක්‍රමයයි. සති 16 චර්යාත්මක චිකිත්සාව, පවුල් උපදේශනය, පුද්ගල උපදේශනය, පියවර 12 සහය, මත්ද්‍රව්‍ය සමග සම්බන්ධ නොවන ක්‍රියාකාරකම් කෙරෙහි උපස්ථම්භනය කිරීම යනාදී චිකිත්සක ක්‍රම යොදා ගත හැකි වේ. දිගු කාලීන භාවිතයේ ප්‍රතිඵලයක් ලෙස ඇති වන වෛද්‍යමය හා පුද්ගලික ගැටලු කෙරෙහි විසඳුම් ලබා දෙන ප්‍රතිකාර ක්‍රමවේදයක් සඳහා ඵලදායී ප්‍රවේශයක් පවතින්නේ නම් පුද්ගලයන්ට මෙතැම්පිටමින් කෙරෙහි පවතින ඇබ්බැහියෙන් මිදිය හැකි වේ.

උත්තේජක ගණයේ කොකේන් වැනි මත්ද්‍රව්‍ය වලින් මෙතම්පිටමින් යම් යම් ආකාරයෙන් වෙනස් වන ආකාරය දැකිය හැකි වේ. එය ව්‍යුහාත්මකව ඇම්පිටමින් වලට සමාන වන අතර ශරීරයේ ප්‍රබෝධාත්මක හැසිරීම් වලට වැදගත් කාර්යභාර්යක් ඉටු කරන ඩෝපමින් ස්නායු සම්ප්‍රේශකය උත්තේජනය කරනු ලබයි. උත්තේජක ගණයේ සියලුම මත්ද්‍රව්‍ය වල හැසිරීම හා මනෝ විද්‍යාත්මක ප්‍රතිඵල සමානකම් දැක්වුවද ඒවා ක්‍රියාත්මක වන මූලික යාන්ත්‍රණයේ ප්‍රධාන වෙනස්කම් කිහිපයක් දක්නට ලැබේ. ශරීරය තුළට ලබා ගත් විට ඉක්මනින් පරිවෘත්තීය ක්‍රියාවලියට ලක් වන කොකේන් වලට වඩා වෙනස්ව මෙතැම්පිටමින් වැඩි ප්‍රතිශතයක් ශරීරයේ වැඩි වේලාවක් නොවෙනස්ව රඳා පවතී. කොකේන් සහ මෙතැම්පිටමින් වල පවතින වෙනස්කම් පහත සටහනෙහි දැක්වේ.

**වගු අංක 02 - කොකේන් සහ මෙතැම්පිටමින් වල පවතින වෙනස්කම්**

| මෙතැම්පිටමින් | කොකේන් |
|---|---|
| උත්තේජකයක් වේ | උත්තේජකයක් වේ |
| කෘතිම රසායන මඟින් නිශ්පාදිතය | ශාක හා රසායන ආශ්‍රිතව නිශ්පාදනය කරයි |
| දුම්පානය හරහා ශරීරයට ලබා ගන්නා විට බලපෑමවැඩි වේලාවක් පවතී | දුම්පානය හරහා ශරීරයට ලබා ගන්නා විට බලපෑම පවතිනුයේ කෙටි වේලාවකි |
| මත්ද්‍රව්‍යයෙන් 50%ක් ශරීරයෙන් ඉවත් වීමට පැය 12 ක් ගතවේ | මත්ද්‍රව්‍යයෙන් 50%ක් ශරීරයෙන් ඉවත් වීමට ගත වන්නේ පැය 01 කි. |
| ඩෝපමින් මුදා හැරීම වැඩි කරන අතර ඩෝපමින් නැවත ලබා ගැනීම අවහිර කරයි | ඩෝපමින් නැවත ලබා ගැනීම අවහිර කරයි |
| රෝගාබාධ සඳහා සීමිත වෛද්‍ය භාවිතය | ශෛල්‍යකර්ම වලදී නිර්වින්දනයක් ලෙස සීමිත ලෙස භාවිතය |

(NIDA,2019,October,https://www.drugabuse.gov/publications/research-reports/methamphetamine/what-methamphetamine)

# 03. පර්යේෂණ ප්‍රතිඵල

## 3.1 මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින්ගේ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක තොරතුරු

### 3.1.1 මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින්ගේ ස්ත්‍රී පුරුෂභාවය

මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින් 50 දෙනෙකුගෙන් 96% (48) ක් පුරුෂයින් වූ අතර ස්ත්‍රීන් 4% (2) ක් විය. මෙතැම්පිටමින් භාවිත කළ කාන්තාවන් පිළිබඳ ව මෙම සමීක්ෂණයේ ප්‍රත්‍යෙක අධ්‍යයන මගින් අනාවරණය කර ගැනීමට හැකිවිය.

### 3.1.2 මෙතැම්පිටමින් භාවිතය හා වයස

මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින්ගේ වයස විමසා බලන කල්හි 38%(19) ක බහුතර ප්‍රතිශතයක් අවුරුදු 22-26 අතර වයස් කාණ්ඩයේ පුද්ගලයන් වූ අතර පුද්ගලයන්ගෙන් 28% (14) ක් අවුරුදු 19 - 21 අතර වයස් කාණ්ඩයට ද, 22% (11) ක් අවුරුදු 27-31 අතර වයස් කාණ්ඩයට ද අයත් වූහ. 6%(3) ක ප්‍රතිශතයක් අවුරුදු 31 ට වැඩි පුද්ගලයින් වූ අතර අවුරුදු 18 හෝ ඊට අඩු පුද්ගලයින් 6%(3) ක් ද විය.

**ප්‍රස්තාර අංක 01 - වයස් සංයුතිය**




(මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2020)

### 3.1.3 මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින්ගේ අධ්‍යාපන තත්ත්වය

අධ්‍යාපන තත්ත්වය සලකා බැලීමේදී පාසල් අධ්‍යාපනය නොලද පුද්ගලයන්ගේ සිට අ.පො.ස උ/පෙළ දක්වා අධ්‍යාපනයේ නිරත වූවන් නියැදිය තුළ නියෝජනය වූ අතර එයින් බහුතරය අ.පො.ස සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලැබූවන් ය. එම අගය 46% (23) වේ. 10 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලැබූවන් 24% (12) ක් ද 26% (13) ක් අ.පො.ස උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලැබූවන් වන අතර අධ්‍යාපනය නොලැබූ සහ ප්‍රාථමික අධ්‍යාපනය ලැබූවන් 4% (2) ක ප්‍රතිශතයක්ද නියෝජනය විය.

### 3.1.4 විවාහක / අවිවාහක තත්ත්වය

මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයන්ගෙන් 90% (45) ක් අවිවාහක පුද්ගලයින් වූ අතර 10% (5) ක් විවාහක පුද්ගලයින් විය.

### 3.1.5 රැකියා තත්ත්වය

අධ්‍යයනට ලක්කළ මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින්ගෙන් 28% (14) ක් ශ්‍රමිකයින් විය. තවද ස්වයං රැකියා/ව්‍යාපාරික කටයුතුවල නිරත වන පුද්ගලයන් 20% (10) නියැදිය තුළ නියෝජනය වී ඇති අතර විධායක නොවන කාර්යාලීය රැකියා කළ පුද්ගලයන් 8% (4) ක් ද රියදුරන් 10% (5) ක් ද ආරක්ෂක අංශවල රැකියාවල නියුතු 6% (3) ක් ද විය. මත්ද්‍රව්‍ය වෙළඳාම, සූදුව වැනි නීතිවිරෝධී කටයුතුවල නිරත වූ පුද්ගලයින් 4% (2) ක් ද සිටි බව මෙහිදී අනාවරණය විය.

**ප්‍රස්තාර අංක 02 - මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින්ගේ රැකියා ව්‍යුහය**




(මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2020)

### 3.1.6 මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින්ගේ ආදායම් සංයුතිය

සමීක්ෂණයට ලක්කළ මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගලයින්ගෙන් 26% (15) ක් ආදායම පිළිබඳ තොරතුරු ලබා දී නොමැති අතර තොරතුරු ලබාදුන් පුද්ගලයින්ගෙන් 54% (20) ක මාසික ආදායම රුපියල් 20,001-50,000 අතර වූ පුද්ගලයන් බවත් 19% (7) ක් රුපියල් 50,001-75,000 අතර ආදායම් මට්ටමක් පැවති පුද්ගලයින් බවත් අනාවරණය විය. රුපියල් 75,001-100,000 අතර ආදායම් මට්ටමක් පැවති පුද්ගලයන් 16 % (6) ක් වූ අතර රු 100,000 ට වැඩි ආදායමක් ලබන පුද්ගලයින් 8% (3) ක් ද නියැදිය තුළ අනාවරණය විය.

**ප්‍රස්තාර අංක 03 - මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින්ගේ ආදායම් සංයුතිය**




(මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2020)

## 3.2 මත්ද්‍රව්‍ය භාවිතය හා එහි උපනතීන්

### 3.2.1 ආසන්නතම සතිය හා මාසය තුළ බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතය

නියැදියට ඇතුළත් වූ මෙතැම්පිටමින් භාවිතා කරන පුද්ගලයන්ගෙන් 12% (6) ක් ආසන්නතම සතිය තුළ හෙරොයින් භාවිත කර ඇති අතර 10% (5) ක් සිගරැට් භාවිතා කර ඇත. තවද ආසන්නතම සතිය තුළ මධ්‍යසාර හා ගංජා භාවිත කළ පුද්ගලයින් 6% (3) ක් වාර්තා වී ඇති අතර මෙතැම්පිටමින් හා පෙති වර්ග භාවිත කළ පුද්ගලයන් 4% (2) ක් බැගින්ද නියැදිය තුළ වාර්තා විය.

### 3.2.2 ආසන්නතම මාසය තුන (03) තුළ බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතය

මෙතැම්පිටමින් භාවිතා කළ පුද්ගලයින් 50 දෙනෙකුගෙන් 90% (45) ක බහුතරයක් ආසන්නතම මාස 3 තුළ මෙතැම්පිටමින් භාවිතකර ඇති අතර 84% (42) ක් හෙරොයින් භාවිතා කර ඇත. පුද්ගලයන්ගෙන් 86% (43) ක් සිගරැට් ද 58% (29) ක් ගංජා ද 54% (27) ක් මධ්‍යසාර ද 60% (30) ක් ඖෂධ අනිසි භාවිතයේ ද යෙදී ඇත. මීට අමතරව මාස 3 ක් ඇතුලත 14% (7) ක් LSD ද 8% (4) ක් ඇම්පිටමින් වර්ගයේ උත්තේජකද භාවිත කර ඇත.

මාස 3ක් ඇතුළත ඖෂධමය පෙති වර්ග භාවිත කළ පුද්ගලයින් භාවිතා කළ පෙති වර්ග සලකා බලනවිට දී Pregabalin, Tramadol, Sudol, Diazepam, ,Artain වැනි ඖෂධ අවභාවිත කර ඇති අතර බහුතරයක් එනම් 93% (27) අවභාවිත කර ඇත්තේ Pregabalin වන අතර Tramadol හා Sudol ද සැලකිය යුතු භාවිතයක් දක්නට ලැබිණ.

**ප්‍රස්තාර අංක 04 - ආසන්නතම සතිය හා මාස 3 තුළ මත්ද්‍රව්‍ය භාවිත තත්ත්වය**




(මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2020)

## 3.3 මෙතැම්පිටමින් භාවිත කරන්නන් අතර බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතය

මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ සිදුකරන ලද පූර්ව සමීක්ෂණ වලදී අනාවරණය වී ඇති පරිදි කිසියම් පුද්ගලයෙකු යම් මත්ද්‍රව්‍යයකට ඇබ්බැහි වූ පසු එම මත්ද්‍රව්‍ය සමඟ වෙනත් මත්ද්‍රව්‍ය එකම අවස්ථාවේ දී භාවිතා කිරීම සම්බන්ධයෙන් අඩු ප්‍රවණතාවයක් ඇත.

එසේ වුවත් මෙතැම්පිටමින් කෙරෙහි ඇබ්බැහි වූ පුද්ගලයෙක් මෙතැම්පිටමින් භාවිතා කරන අවස්ථාවේදී ද වෙනත් මත්ද්‍රව්‍යයන් ඒ සමග භාවිතා කර ඇති බව සමීක්ෂණ දත්ත විශ්ලේෂණය මගින් හෙළිවිය. මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින්ගෙන් 95% (45) ක් මෙතැම්පිටමින් භාවිතා කරන අවස්ථාවේදී කිසියම් වෙනත් මත්ද්‍රව්‍යයක් ද ඒ සමග මිශ්‍රව භාවිතා කර ඇත.

**ප්‍රස්තාර අංක 05 - මෙතැම්පිටමින් භාවිතකළ පුද්ගලයින් භාවිත බහුවිධ මත්ද්‍රව්‍යය**




(මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2020)

එසේ භාවිතා කළ මත්ද්‍රව්‍යය අතර බහුතරයක් මෙතැම්පිටමින් සමග හෙරොයින් භාවිත කර ඇත. එය මෙතැම්පිටමින් සමග වෙනත් මත්ද්‍රව්‍යයන් භාවිත කළ පුද්ගලයින්ට ප්‍රතිශතයක් ලෙස 69% (31) කි. තවද එම පුද්ගලයින්ගෙන් 47% (21) ගංජා ද 29% (13) ක් පෙතිවර්ග ද මධ්‍යසාර භාවිත කළ 7% (3) ක් ද වාර්තා විය. මීට අමතරව සිගරට්, එල්. එස්. ඩී හා කොකේන් යන මත්ද්‍රව්‍යන්ද මෙතැම්පිටමින් සමග භාවිත කළ පුද්ගලයින් 11% (5) ක් සමීක්ෂණය තුළින් අනාවරණය විය.

## 3.4 මෙතැම්පිටමින් නොමැති විටදී භාවිතකළ විකල්ප මත්ද්‍රව්‍යය

මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයන්ගෙන් මෙතැම්පිටමින් නොමැති අවස්ථාවලදී භාවිත කරන විකල්ප මත්ද්‍රව්‍යයන් පිළිබඳව විමසන ලදී. එහිදී ඔවුන්ගෙන් 64% (32) මෙතැම්පිටමින් වෙනුවට විකල්ප මත්ද්‍රව්‍යය භාවිත කළ බව ප්‍රකාශ කර තිබිණි. බහුතරය, එනම් විකල්ප මත්ද්‍රව්‍යය භාවිත කර ඇති පුද්ගලයින්ගෙන් 69% (22) ක් හෙරොයින් ද 25% (8) ක් ඖෂධමය පෙති වර්ග ද 13% (4)ක් ගංජා ද භාවිත කළ ඇති බව ප්‍රකාශ කර ඇත. මීට අමතරව කොකේන් හා එල්. එස්. ඩී ද විකල්ප මත්ද්‍රව්‍ය ලෙස භාවිතා කළ පුද්ගලයන් සමීක්ෂණය තුළන් වාර්තා විය.

## 3.5 මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ වයස් මට්ටම් හා එහි උපනතීන්

මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින් එක් එක් මත්ද්‍රව්‍යයන් භාවිතයට යොමු වූ වයස් කාණ්ඩ සලකා බලන විටදී 40% (20) ක බහුතරයක් වයස අවුරුදු 15 හෝ ඊට අඩු වයස් කාණ්ඩය තුළ සිගරට් භාවිත කර ඇති අතර සිගරට් භාවිතය සඳහා යොමුවූ සාමාන්‍ය වයස අවුරුදු 16 බවද අනාවරණය කළ හැකිය.

**ප්‍රස්තාර අංක 06 - මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ප්‍රථමයෙන් යොමු වූ වයස් මට්ටම්**




(මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2020)

මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින් මද්‍යසාර, ගංජා, හෙරොයින් හා ඖෂධ අනිසි භාවිතයේ යෙදුනු පුද්ගලයන් වන අතර ඔවුන්ගෙන් බහුතරයක් වයස අවුරුදු 16-18 වයස් කාණ්ඩ තුළ භාවිතය ආරම්භ කර ඇති අතර එක් එක් මත්ද්‍රව්‍යයන් ප්‍රථම වරට භාවිත කළ සාමාන්‍ය වයස සැලකීමේදී මද්‍යසාර හා ගංජා, වයස අවුරුදු 16 දී ද හෙරොයින් හා ඖෂධමය පෙති වර්ග කෙරෙහි ප්‍රථම වරට වයස අවුරුදු 18 දී ද යොමුවී ඇති බව අනාවරණය විය.

මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින් ප්‍රථම වරට මෙතැම්පිටමින් භාවිතයට යොමු වීමේ වයස් කාණ්ඩ සලකා බැලීමේදී බහුතරයක් වයස 16-18 දී ආරම්භ කර ඇත. මෙතැම්පිටමින් වලට යොමුවීමේ සාමාන්‍ය වයස අවුරුදු 19 ක් විය. තවද මෙතම්පිටමින්, LSD හා ඇම්පිටමින් වර්ගයේ උත්තේජක ප්‍රථම වරට භාවිත කළ සාමාන්‍ය වයස් පිළිවෙලින් වයස අවුරුදු 23, 24 හා 22 ක් ලෙස වාර්තා විය.

## 3.6 මෙතැම්පිටමින් ශරීරගත කර ගැනීම

මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගලයින්ගේ බහුතරය එනම් 72% (36) වයිනීස් ක්‍රමය (බල්බ් එකක් තුළ මෙතැම්පිටමින් දමා රත්කර) තමන් ආඝ්‍රාණය කර භාවිත කර ඇති අතර 36% (18) ක් දුම්පානයක් ලෙසද 12% (6) ක් නාසයෙන් ඉරීම මගින්ද 2% (1) ක් එන්නත් කර ගැනීමෙන් ද සිදු කර ඇත.

**ප්‍රස්තාර අංක 07 - මෙතැම්පිටමින් ශරීරගත කර ගැනීම් සඳහා යොදාගත් ක්‍රම**




(මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2020)

## 3.7 මෙතැම්පිටමින් මුලින්ම හඳුන්වා දීම

මෙතැම්පිටමින් භාවිතය සඳහා පුද්ගලයින් ප්‍රථම වරට යොමුවීම පිළිබඳව සලකා බැලීමේදී මෙතැම්පිටමින් භාවිතා කළ පුද්ගලයින් වැඩිම ප්‍රතිශතයක් එනම්, 92% (46) මෙතැම්පිටමින් භාවිතය සඳහා සිය යහළුවෙකු මගින් යොමුවී ඇති අතර 4% (2) ක් බන්ධනාගාර ගතවී සිටි අවස්ථාවලදී ද 4% (2) ක් වෙනත් පුද්ගලයින් මගින් ද යොමු වී ඇත.

## 3.8 මෙතැම්පිටමින් භාවිතා කරනු ලබන ස්ථාන

මෙතැම්පිටමින් භාවිත කළ ස්ථාන පිළිබඳව සලකා බැලීමේදී මෙතැම්පිටමින් භාවිතා කළ පුද්ගලයින්ගෙන් 70% (35) ක බහුතරයක් මිතුරෙකුගේ නිවසේ සිට භාවිත කර ඇති අතර 36% (18) ක් තම නිවසේද 22% (11) ක් රාත්‍රී සාද වල ද 18% (9) ක් හෝටල් වල/ විවිධ වෙළඳසැල්/ බන්ධනාගාරය වැනි වෙනත් ස්ථානවල භාවිත කර ඇත.

මෙතැම්පිටමින් කෙරෙහි ඇබ්බැහිවූ පුද්ගලයින් ඇසුරින් සිදුකරන ලද ප්‍රත්‍යෙක අධ්‍යයන අනුව,

" මීගමුවේ ගොඩක් පාටි තියන පැත්තක්. සතියකට වතාවක් වත් පාටියකට යන්න පුළුවන්. විශේෂයෙන් බීච් පාටි කියන්නේ එලි වෙනකල්ම එක විදියට විනෝද වෙන්න පුළුවන් තැන්. බීච් පාටි වල මෙතම්පිටමින් කියන්නේ අනිවාර්ය ඩ්‍රග් එක. එල්.එස්.ඩී. ත් ඒ වගේ. බීච් පාටි වලටම විශේෂයි. "

### මෙතැම්පිටමින් භාවිතය හා සමාජ මාධ්‍ය

මත්ද්‍රව්‍ය භාවිතයට යොමුකරගැනීම හා මත්ද්‍රව්‍ය අලෙවි කිරිම සමාජ මාධ්‍ය හරහා සිදුවන විවිධ මූලාශ්‍ර හරහා බව හෙලි වූ බැවින් මෙතැම්පිටමින් භාවිතය සම්බන්ධව ද එවැනි ප්‍රවණතාවයන් ඇත්දැයි මෙහිදී අධ්‍යනය කළ අතර සමීක්ෂණයට භාජනය කළ මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින්ගෙන් 28% (14) ක් එසේ මෙතැම්පිටමින් සම්බන්ධ සමාජ ජාලා වෙබ් අඩවි ඇති බව ප්‍රකාශ කර ඇත. පුද්ගලයන්ගෙන් 56% ක් ඒ පිළිබඳව තොරතුරු නොදන්නා බවත් 28% ක් එසේ නොමැති බවත් ප්‍රකාශ කර ඇත. සමාජ ජාල වෙබ් අඩවි පිළිබඳව දැනුවත් පුද්ගලයින්ගෙන් 29% ක් සමාජ ජාලා වෙබ්අඩවි වල සාමාජිකයින් වී ඇති බවත් අනාවරණය විය. එම සමාජ ජාලා වෙබ් අඩවි වල මෙතැම්පිටමින් භාවිතා කරන ආකාරය, මෙතැම්පිටමින් සම්බන්ධ විවිධ වීඩියෝ හා පින්තූර ආදිය හුවමාරු වේ. තවද ඒවා මිලදී ගැනීමට පහසුකම් සලසා දීම හා අදාල පුද්ගලයන් හා සම්බන්ධීකරණය ද ඒ තුළින් සිදුවන බව තවදුරටත් හෙලි විය.

## 3.9 මෙතැම්පිටමින් සදහා භාවිතා කරන වෙනත් නාම

මෙතැම්පිටමින් භාවිතා කරන පුද්ගලයින්ගෙන් බහුතරය එනම් 42% (21) ක් ලෙස "සීතල" ලෙස හඳුන්වන අතර 12% (6) ක් "ක්‍රිස්ටල්" ලෙසද "ගල්/කම්බි/කැට" යනාදී නම් වලින් ද හඳුන්වන බව පුද්ගලයින්ගෙන් 8% (4) ක් ප්‍රකාශ කර ඇත.

## 3.10 මෙතැම්පිටමින් භාවිතයේ කෙටිකාලීන කායික හා මානසික බලපෑම

මෙතැම්පිටමින් භාවිත කිරිමෙන් පසු කෙටිකාලීනව සිදුව ඇති කායික හා මානසික වෙනස්කම් සලකා බැලීමේදී පහත තොරතුරු අනාවරණය විය.

**වගු අංක 03 - මෙතැම්පිටමින් භාවිතයේ කෙටිකාලීනව සිදුවී ඇති කායික හා මානසික වෙනස්කම්**

| කායික වෙනස්කම් | ප්‍රතිශතය | මානසික වෙනස්කම් | ප්‍රතිශතය |
|---|---|---|---|
| නින්ද නොයාම | 72% | දැඩි උත්තේජක ස්වභාවය | 30% |
| ආහාර අරුචිය | 36% | | |
| දත්මිටි කෑම, දත් එකට එකමත එක තදවීම | 26% | | |
| ඉහළ ශරීර උෂ්ණත්වයන් ඇති වීම | 8% | | |
| වෙනත් | 16% | | |
| හෘද ස්පන්දනය ඉහළ යාම, හුස්ම ගැනීමේ අපහසුව<br>දියර වර්ග පානය කිරීමේ අවශ්‍යතාවය,අධික ලෙස මුත්‍රා පිටවීම<br>හිසේ රදය, වමනය, ඇඟ දරදඬු වීම | | | |

(මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2020)

## 3.11 මෙතැම්පිටමින් භාවිතයේ දිගුකාලීන කායික හා මානසික බලපෑම

**වගු අංක 04 - මෙතැම්පිටමින් භාවිතයේ දිගුකාලීන සිදුවී ඇති ශාරීරික හා මානසික වෙනස්කම්**

| කායික වෙනස්කම් | ප්‍රතිශතය | මානසික වෙනස්කම් | ප්‍රතිශතය |
|---|---|---|---|
| ඇඟ කෙට්ටුවීම් ස්වභාවය හා දුර්වලවීම | 32% | මානසික විකෘතිතාවයන් සමග ප්‍රචණ්ඩකාරී ස්වභාවය | 10% |
| පපුවේ වේදනාව, | 12% | අමතකවීම් | 12% |
| ශරිරය තුළ තුවාල ඇතිවීම | 6% | භ්‍රාන්තිකාරක හැගීම් ඇති වීම | 4% |
| දත් දිරායාම | 4% | | |
| වෙනත් | 12% | | |
| තොල් පුපුරා යාම<br>ශරිරය අවලස්සන වීම<br>දිවේ හා තුවාල වල යම් කිසි මැලියම් වැනි ස්වභාවයක් බැදී පැවතීම<br>මුත්‍රා මාර්ගයේ ආසාදන | | | |

(මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2020)

ප්‍රස්තාර අංක 08 - මෙතැම්පිටමින් භාවිතයේ කෙටිකාලීනව හා දිගුකාලීන ශාරීරික හා මානසික වෙනස්කම්




(මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2020)

මෙතැම්පිටමින් භාවිතය කෙරෙහි ඇබ්බැහිවූ පුද්ගලයෙකු කෙටිකාලීනව හා දිගුකාලීනව මුහුණුදුන් ශාරීරික හා මානසික වෙනස්කම් පිළිබඳ සිදුකරන ලද ප්‍රත්‍යෙක අධ්‍යන අනුව,

"මෙතැම්පිටමින් වලට ඇබ්බැහි වෙන කාලේ වෙද්දි කෑමක් බීමක් ගැන කිසිම අවබෝධයක් තිබුනෙ නෑ. මුලු ඇඟම කෙට්ටු වෙන්න ගත්තා. හරියටම පිළිකා රෝගියෙක් වගේ. මට දැනෙන්න ගත්තා මගෙ අත් වල ඇඟිලි හොඳටම කෙට්ටු වෙලා දික් වෙනවා වගේ. පපුව හිර කරනවා වගේ දැනෙනවා. මෙතැම්පිටමින් අරගෙන මුල් විනාඩි කීපයෙත් ඒ වගේ පපුව හිර වෙන ගතියක් දැනෙනවා. ඒ මෙතැම්පිටමින් ඇඟට වැටිලා මත්වෙන්න පටන් ගනිද්දිම. ඒත් පස්සෙ කාලෙක ආව පපුවෙ හිරවීම ඊට වඩා වෙනස්. ඒක පාලනය කර ගන්න අමාරු වුනා. නිදා ගන්නෙම නැති තරම්. නින්ද ගියත් ඉක්මනින් ඇහැරෙනවා. රෑට ඇඳට ගියාම කවුරුහරි කෙනෙක් ඇවිත් මාව උස්සගෙන යනවා වගේ මට දැනෙන්න පටන් ගත්තා. ඒක ලොකු බයක් වගේ දෙයක්. හදිස්සියේම මම හිතන්නෙවත් නැති රූප මැවෙන්න ගත්තා. මට ඒක මහා බයක්. මම පෙති ගන්න කාලේ ආටේන් වැඩි ප්‍රමාණයක් ගත්ත වෙලාවෙත් මට ඒ විදියෙ රූප මැවිලා පෙනිලා තියනවා. කොටි වගේ කකුල් හතරේ සත්තු වර්ගයක් මං දිහාට එනවා පේනවා. නින්ද ගිය පොඩි වෙලාවටත් මට ඒ වගේ රූප පේනවා. ඒ වගේම පොඩි තුවාලයක් වුනත් ඒක හොඳ වෙන්නේ නෑ. සෑහෙන කාලයක් පෑරි පෑරි තියනවා."

## 3.12 මෙතම්පිටමින් භාවිතය හා ඇබ්බැහිකාරීත්වය

**(මෙතම්පිටමින් සම්බන්ධ APA අනාවරණ පරික්ෂාව මගින්)**

භාවිත කළ පුද්ගලයින් 50 දෙනෙකු සමීක්ෂණයට භාජනය කළ අතර ඔවුන්ගෙන් මෙතැම්පිටමින් භාවිතයේ මට්ටම සම්බන්ධව නිශ්චිතව අනාවරණය කර ගැනීම සඳහා ඇමරිකානු මනෝ විද්‍යා සංගමය විසින් හඳුන්වා දී ඇති මෙතැම්පිටමින් සම්බන්ධ අනාවරණ පරික්ෂාව සිදු කරන ලදී. එහිදී සමීක්ෂණයට භාජනය කළ මෙතැම්පිටමින් භාවිත කළ 64% (32) දෙනෙක් මෙතැම්පිටමින් සම්බන්ධ ඉහළ ඇබ්බැහිකාරිත්වයක් පෙන්නුම් කරයි. 16%(8) ක් එතරම් ඇබ්බැහිකාරිත්වයක් නොමැති අවස්ථානුකූලව මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගලයින් බව අනාවරණ පරීක්ෂාව මගින් තහවුරු විය. අනාවරණ පරික්ෂාව සඳහා මෙතැම්පිටමින් සම්බන්ධ APA අනාවරණ පරීක්‍ෂාව උපග්‍රන්ථ 01 යටතේ දක්වා ඇත (APA, 2019,https://www.rehabs.com/assessments/).

## 3.13 මෙතැම්පිටමින් භාවිතය හා එහි බලපෑම

මෙතැම්පිටමින් භාවිතය පුද්ගලයන්ට ශාරීරිකව හා මානසික දැඩි බලපෑම් කළ හැකි අතර ඒ සම්බන්ධව තවදුරටත් විස්තරාත්මකව විග්‍රහ කිරීමට ඉහත සකස් කළ දර්ශකය භාවිත කළ හැකිය. මෙහිදී මෙතැම්පිටමින් භාවිතයෙන් පසු පුද්ගලයන්ගෙන් 90% (45) කට පමණ තමාව පාලනය කර ගැනීමට නොහැකි තත්ත්වයකට පත්වී ඇති අතර පුද්ගලයින්ගෙන් 82% (41) කට මෙතැම්පිටමින් දිනෙන් දින භාවිතයට යොමුවීමේ ශාරීරික හා මානසික අවශ්‍යතාවය ක්‍රමයෙන් වැඩිවන ස්වභාවයක් මතුවී ඇත. ඊට අමතරව පුද්ගලයන්ගෙන් 74% (37) ක් මෙතැම්පිටමින් භාවිතය හා ඒ ආශ්‍රිත කටයුතුවල දැඩි ලෙස යොමු වීම් ද 64% (32) කට සමාජ සම්බන්ධතාවල බිඳ වැටීම් ද 58% (29) කට මෙතැම්පිටමින් භාවිතය ඉහළ යාමත් හා ඒ මගින් දැඩිව විරමණ ලක්ෂණ ද මතුවී ඇත.

**ප්‍රස්තාර අංක 09 - මෙතැම්පිටමින් භාවිතය හා එහි බලපෑම**




(මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2020)

පුද්ගලයින්ගෙන් 48% (24) ක් සඳහා සෞඛ්‍ය ගැටලු වලට මුහුණ දීමට සිදුවී ඇති අතර ඔවුන් වැඩි වශයෙන් දන්ත ගැටලු හා අධික ලෙස ශරීරයේ බර අඩුවීමේ වැනි සෞඛ්‍ය ගැටලු වලට මුහුණ දී ඇත. ඇතැම් පුද්ගලයන්ගේ පපුවේ වේදනාව, රුධිරය කැටි ගැසීම, ශ්වසන ආබාධ හා භ්‍රාන්තිකාරී හෝ ආතතිකාරී තත්ත්වයන්ට ද මුහුණ දී ඇත.

තවද මෙතැම්පිටමින් භාවිතා කළ පුද්ගලයන්ගෙන් 48% (24) ක් දැඩිව විරමණ ලක්ෂණ වලට මුහුණ දී ඇති අතර මෙතැම්පිටමින් භාවිතා කළ බහුතර පිරිසකට ආහාර අරුචිය, නින්ද නොයෑම, මෙතැම්පිටමින් භාවිත කිරීමට නොමැති විටදී දැඩි ආතතිකාරී තත්ත්වයන් ඇති වීම හා මතකය හා ප්‍රජානනය දුර්වල වීමක් අනාවරණය විය. මෙතැම්පිටමින් සම්බන්ධ APA අනාවරණ පරීක්ෂාව මගින් අනාවරණය කරගත් තොරතුරු විස්තරාත්මකව පහත පරිදි ඉදිරිපත් කළ හැකිය.

**ප්‍රස්තාර අංක 10 - මෙතැම්පිටමින් භාවිතය හා එහි බලපෑම සම්බන්ධ විස්තරාත්මක තොරතුරු**




(මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2020)

මෙතැම්පිටමින් භාවිතය සම්බන්ධ ඉහත තොරතුරු විශ්ලේෂණය කිරීමේදී මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින්ගෙන් 68% ක් සදහා මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඉවත්වීමට අවශ්‍යතාවයකින් සිටින අතර 36%ක් මෙතම්පිටමින් වලින් ඉවත් වීමට උත්සහකර එය අසාර්ථක වී ඇත. තවද මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින්ගෙන් 10%ක් සදහා මෙතැම්පිටමින් අධිමාත්‍රා වී ඇත.

මෙතැම්පිටමින් කෙරෙහි ඇබ්බැහිවූ පුද්ගලයින් ඇසුරින් සිදුකරන ලද ප්‍රත්‍යෙක අධ්‍යනයක විස්තර පහත වේ. මෙමගින් මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයෙක් කෙටිකාලීනව හා දිගුකාලීනව මුහුණුදුන් ශාරීරික හා මානසික වෙනස්කම් මෙම ප්‍රකාශ වලින් තවදුරටත් පැහැදිලි කර ගත හැකිය.

" ඒත් සික් එන තරමට ඇබ්බැහි වුන කෙනෙක්ට ගැලවෙන්න හරිම අමාරුයි. හෙරොයින් සික් එකට වඩා ඒක සෑහෙන අමාරුයි. ඇග ඇතුලෙන් කරන්ට් එකක් දුවනවා වගේ දැනෙනවා. ඒක ඉවසන්න හරිම අමාරුයි. කොළඹ වතු වල හිටිය සමහර අපේ යාලුවෝ මෙතැම්පිටමින් නිසාම ජීවිතේ නැති වෙලා ගියා. මැරෙන කාලෙ වෙද්දි ඇට සැකිල්ලක් වගේ වෙලා අන්තිමට මැරුනේ. "

" එක වතාවක් මං හෙරොයින් ගන්නේ නැතිව මාසයක් විතර එක දිගටම මෙතැම්පිටමින් ම බිව්වා. ඒ කාලේ ඩෝස් එක සෑහෙන්න වැඩිපුර ගත්තා. නින්ද යන්නෙම නැති නිසා එක දිගට නිදි නැතුව වැඩ කළා. කෑම කෑවේ කොයි වෙලේද නැත්තේ කොයි වෙලේද කියලා මට මතකයක් තිබුනේ නෑ. එහෙම ඉන්නකොට දවසක් කැෂියර් එක ළඟ මං සිහිය නැතුව වැටිලා ඉඳලා කට්ටිය මාව රෝහල්ගත කරලා තිබුනා. සේලයින් එහෙම දීලා දවස් කීපයකට පස්සේ ආවේ. ඇවිල්ලත් මං මත්ද්‍රව්‍ය ගන්න එක නැවැත්තුවේ නෑ. "

" මම ඉස්කෝලෙන් අයින් වුනාට පස්සේ මට ප්‍රේම සම්බන්ධයක් තිබුනා. ඒ ගෑණු ළමයා ගැන හොයලා බලන එක මට මෙතැම්පිටමින් පාවිච්චියත් එක්ක කොහොමටවත් කරන්න බැරි උනා. ඒ නිසා ඒ සම්බන්දෙත් නැවතුනා. ගොඩක් වෙලාවට ගෙදරින් ගත්ත සල්ලි ප්‍රමාණ ගැන මට මතකයක් වත් නෑ. අපිට අම්මටවත් යුතුකම් ඉටු කරන්න බැරි වුනා. හැම විනාඩියක්ම ගෙවුනේ මත්ද්‍රව්‍යක් එක්ක. මං මානසිකවත් ශාරීරිකවත් සෑහෙන දුර්වල වෙලා "

" එත් මම එක දිගට මෙතැම්පිටමින් ගන්න එක නැවැත්තුවා. මෙතැම්පිටමින් නිසා මගේ ඇග දිරලම ගියා. ඇග ඇට සැකිල්ලක් වගේ වුනා. ඒ වගේම මගේ කල්පනාව සෑහෙන දුර්වල වුනා. විනාඩියනට කලින් කියන දේ ඊළඟ විනාඩියේදී මට අමතක වෙන්න ගත්තා. ඒ නිසාම වැඩ කරද්දී සෑහෙන අපහසුතා වලට මුහුණ දෙන්න වුනා. "

### 3.14 මෙතැම්පිටමින් භාවිතයේ ආර්ථීක පිරිවැය

සමීක්ෂණ නියැදිය තුළ නියෝජනය වූ මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින්ගෙන් 34% (17) ක් දිනපතා මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගලයින් වූ අතර ඔවුන් සාමාන්‍යයෙන් දිනකට 4 වතාවක් මෙතැම්පිටමින් භාවිතා කරන අතර ඒ සඳහා සාමාන්‍යයෙන් දිනකට මෙතැම්පිටමින් පැකට් 2 ක් භාවිතා කර ඇත. තවද මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින් අතර උපරිම වාර 25 ක් දක්වා භාවිත කළ පුද්ගලයින් ද දිනකට ඒ සඳහා මෙතැම්පිටමින් පැකට් උපරිම 10 ක් දක්වා භාවිතා කළ පුද්ගලයින්ද සමීක්ෂණයෙන් හමුවී ඇත.

මෙතැම්පිටමින් භාවිතය සඳහා එක් පුද්ගලයෙකුට දිනකට සාමාන්‍යයෙන් රුපියල් 3000 ක් වියදම් වී ඇති අතර දිනපතා මෙතැම්පිටමින් භාවිතා කළ පුද්ගලයෙකු අවම වශයෙන් රුපියල් 1000 ක් වත් වැය කළ යුතු අතර එය රුපියල් 10000 දක්වා උපරිම විය හැකි බවත් සමීක්ෂණ තොරතුරු තුලින් අනාවරණ විය.




මෙතැම්පිටමින් පැකට්ටුවක වීථි මට්ටමේ සාමාන්‍ය මිල රුපියල් 2500 පමණ වන අතර එය ප්‍රදේශය හා අවස්ථාව අනුව වෙනස්වන අතර ඇතැම් අවස්ථාවලදී රුපියල් 500 කට ද අලෙවි වූ අතර තවත් ප්‍රදේශවල රුපියල් 8000 උපරිම වූ අවස්ථාද පැවැති බව සමීක්ෂණ තොරතුරු මගින් හෙලිවිය. තවද වීථි මට්ටමේ මෙතැම්පිටමින් පැකැට්ටුවක සාමාන්‍ය බර මිලි ග්‍රෑම් 300 වන අතර එය වීථි මට්ටමේ හෙරොයින් පැකැට්ටුවක බරට වඩා ඉහළ අගයන් ගන්නා බවය.

### 3.15 මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින් මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා යොමුවීම

සමීක්ෂණයට භාජනය කළ මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින්ගෙන් 86% (43) ක් කිසියම් මත්ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් වැරදිකරුවෙකු වී සිටි අතර ඔවුන්ගෙන් බහුතරය මත්ද්‍රව්‍ය ළඟ තබා ගැනීම සම්බන්ධයෙන් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 84% (36) ක් වේ. තවද පුද්ගලයන්ගෙන් 21% (9) ක් මත්ද්‍රව්‍ය විකිණීම සම්බන්ධව ද 5%(2) ක් මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධයෙන් ද අත්අඩංගුවට පත්වඇති බව අනාවරණය විය. මත්ද්‍රව්‍ය සම්බන්ධව අත්අඩංගුවට පත්වූ මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගලයන්ගෙන් 9% ක් පමණ මෙතැම්පිටමින් සම්බන්ධ වැරදි වලට හසුවී ඇති බවත් මෙහිදී හෙළිවිය.

### 3.16 මෙතැම්පිටමින් භාවිතය සඳහා ප්‍රතිකාර වලට යොමු වීම

සමීක්ෂණය සඳහා සහභාගී කරගත් මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින්ගෙන් 20% (10) ක් ප්‍රතිකාර සඳහා යොමුවී ඇති අතර පුද්ගලයින්ගෙන් 96% (48) ක් ප්‍රතිකාර සඳහා යොමු වීමට සිය කැමැත්ත ප්‍රකාශ කරන ලදී. මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින්ගේ පවුල්වල සාමාජිකයින්ගේ මෙතැම්පිටමින් භාවිත කිරීමේ ප්‍රවණතාවය අඩු මට්ටමක පවතින අතර ඔවුන්ගේ යහලුවන් මෙතැම්පිටමින් භාවිතා කරන බවත් එය ප්‍රතිශතයක් ලෙස 96% (48) ක් විය.

**ප්‍රස්තාර අංක 11 - මෙතම්පිටමින් භාවිතය සඳහා ප්‍රතිකාර වලට යොමුවීම**




(මූලාශ්‍රය - සමීක්ෂණ දත්ත 2020)

## 04. නිගමන

- ✓ මෙතැම්පිටමින් භාවිත කළ පුද්ගලයින්ගෙන් බහුතරය අවිවාහක,අඩු අධ්‍යාපන මට්ටම් ලැබූ වයස අවුරුදු 19-26 අතර තරුණ පිරිස් වන අතර ඔවුන් අතර ක්‍රමයෙන් ජනප්‍රිය උත්තේජක මත්ද්‍රව්‍යයක් බවට පත්වෙමින් තිබෙන බවත් එය කාන්තාවන් අතර ද කිසියම් ප්‍රවණතාවක් ඇතිවෙමින් පවතින බවයි.
- ✓ මෙතැම්පිටමින් භාවිත කරන පුද්ගලයන් හෙරොයින්, ඖෂධ අනිසි භාවිතය, ගංජා, මද්‍යසාර, සිගරැට්, කොකේන් හා ඇම්පිටමීන් වැනි බහුවිධ මත්ද්‍රව්‍යන් භාවිත කිරීමක් දක්නට ඇති අතර එම මත්ද්‍රව්‍ය මෙතැම්පිටමින් හා එකම අවස්ථාවේදී මිශ්‍රව භාවිත කිරීමක් පවතින බව ද තහවුරු විය.
- ✓ මෙතැම්පිටමින් භාවිත කිරීමේ දී බහුතරයක් චයිනීස් ක්‍රමයෙන් ද ඉතා සුලු පිරිසක් එන්නත් කර ගැනීමෙන් භාවිත කරන අතර බහුතරයක් මිතුරන්ගේ බලපෑම මඟින් යොමු වී ඇත.
- ✓ මෙතැම්පිටමින් භාවිතයේ කායික හා මානසික හා අනෙකුත් මත්ද්‍රව්‍ය වලට සාපේක්ෂව පුද්ගලයා කෙරෙහි ඉතාමත් ඉහළ බලපෑමත් සිදුකරන බව නිගමනය කළ හැකිය.
- ✓ පුද්ගලයෙක් සාමාන්‍යයෙන් දිනකට වාර 4 ක් මෙතැම්පිටමින් භාවිත කරන අතර ඒ සඳහා දිනකට සාමාන්‍යයෙන් පැකට් 2ක් භාවිත කරයි. තවද මේ සඳහා පුද්ගලයෙකුට සාමාන්‍යයෙන් දිනකට රුපියල් 3000ක් වැයවන බැවින් අනෙකුත් මත්ද්‍රව්‍ය වලට සාපේක්ෂව ඉහළ ආර්ථික පිරිවැයක් පවතින බව නිගමනය කළ හැකිය.
- ✓ මෙතැම්පිටමින් භාවිතයෙන් අනතුරුව කොට්කාලීන හා දිගුකාලීනව කායික හා මානසික වෙනස්කම් පුද්ගලයා තුළ සිදුවී ඇති බැවින් අනෙකුත් මත්ද්‍රව්‍ය වලට සාපේක්ෂව මෙතැම්පිටමින් මඟින් පුද්ගලයාට හා සමාජයට එයින් වන බලපෑම ඉතාමත් අහිතකර වේ.
- ✓ මෙතැම්පිටමින් භාවිත කරන්නන්ගෙන් 20% ක් මත්ද්‍රව්‍ය ප්‍රතිකාර සඳහා යොමුවී ඇති අතර මෙම පුද්ගලයින්ගෙන් 90%ක් වැනි ඉහළ පිරිසක් ප්‍රතිකාර ක්‍රියාවලියකට යොමුවීමට කැමති බව වාර්තා විය.

## 05. යෝජනා

- මෙතැම්පිටමින් භාවිතය කෙරෙහි යොමුවී සිටින පුද්ගලයින් සඳහා විශේෂ ප්‍රතිකාර ක්‍රියාවලියක් ආරම්භ කිරීම හා මෙතැම්පිටමින් ව්‍යාප්තිය හා එහි හානිය අවම කිරීමට ප්‍රජා මූලික උපදේශන වැඩසටහන් බාහිර සේවා නිලධාරීන් හරහා ආරම්භ කිරීම.
  මෙහිදී,
  - ප්‍රජා මූලික උපදේශන වැඩසටහන් බාහිර සේවා නිලධාරීන් හරහා ආරම්භ කිරීම
  - අනාවරණ පරීක්ෂාවක් හරහා ඔවුන්ගේ ඇබ්බැහිකාරිත්වයේ මට්ටම පිළිබඳව නිවැරදිව හඳුනාගැනීම
  - දැඩි ඇබ්බැහිකාරී පුද්ගලයින් සඳහා ආයතනගත ප්‍රතිකාර හා අවශ්‍යතාවය අනුව සිදුවී ඇති සෞඛ්‍ය හානි හැකිතාක් ඉවත් කිරීමට වෛද්‍ය ප්‍රතිකාර ද ලබා දිය යුතුවේ.
- නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල නිලධාරීන් සඳහා මෙතැම්පිටමින් සම්බන්ධ තාක්ෂණික දැනුම ලබා දීම හා ඊට එරෙහිව බලගැන්වීම.
- මෙතැම්පිටමින් ඇතුළු උත්තේජක මත්ද්‍රව්‍ය බහුලව භාවිත වන සහ ප්‍රවර්ධනය කරන රාත්‍රී සමාජ ශාලා හා වෙරළ සාද වැලැක්වීම.
- නිවාරණ වැඩසටහන් තුළදී මෙම ප්‍රවණතාවයන් පිළිබඳව අවධානය යොමු කරමින් කටයුතු කිරීම.

## ආශ්‍රිත ග්‍රන්ථ -


APA, 2019,https://www.rehabs.com/assessments

National Dangerous Drugs Control board. Handbook of Drug Abuse Information in Sri Lanka.rajagiriya: National Dangerous Drugs Control board; 2020.

NIDA,2019,Mayhttps://d14rmgtrwzf5a.cloudfront.net/sites/default/files/drugfacts-methamphetamine.pdf

NIDA,2019,October,https://www.drugabuse.gov/publications/research-reports/methamphetamine/what-methamphetamine

## උප ග්‍රන්ථ -

**වගු අංක 01 - මෙතම්පිටමින් සම්බන්ධ APA අනාවරණ පරික්ෂාව**

| | |
|---|---|
| **Screening Quiz** | |
| **භාවිතයේ ක්‍රමික වර්ධනය (Increase of Consumption)** | |
| 1 | ඔබ මෙතම්පිටමින් කලින් භාවිත කළ ප්‍රමාණයට වඩා වැඩි මාත්‍රාවලින් දැනට භාවිත කරන්නේද? |
| 2 | ඔබ මුලින්ම මෙතම්පිටමින් භාවිත කිරීමට පටන් ගත් දා සිට ඔබගේ එක් එක් කාලසීමාව තුළ භාවිතය වැඩිවන බව ඔබ දුටුවාද? |
| 3 | ඔබ මෙතම්පිටමින් භාවිත කළ පසු එය නැවැත්වීමට අපහසු බවක් දැනුනේද? |
| **භාවිතයේ ප්‍රතිචාරාත්මක බලපෑම ( Tolerance )** | |
| 1 | අඩු මාත්‍රාවලින් මෙතම්පිටමින් භාවිත කළ විටදී එහි බලපෑමක් නොදැනෙන්නේද? |
| 2 | මෙතම්පිටමින් භාවිත කිරීමේදී මාත්‍රාව වැඩිකිරීමට සිතෙන්නේද? |
| **විරමණ ලක්ෂණ** (Withdrawals ) | |
| 1 | ඔබ මෙතම්පිටමින් භාවිතය නැවැත්වීමෙන් පසු තෙහෙට්ටුව, සිහින දැකීම, නින්ද නොයාම, ආහාර රුචිය වැඩිවීම, මතකය දුර්වල වීම හා ප්‍රජානන (තර්කනය/භාෂණය ආදි) හැකියා දුර්වලවීමක් අත්විඳින්නේද? |
| 2 | මෙතම්පිටමින් නොමැතිවිටදී ජීවිතය පිළිබඳව අවශ්‍යතාවක් නොමැතිව සියදිවි හානිකර ගැනීමට සිතුනේද? |
| 3 | මෙතම්පිටමින් භාවිත කිරීමට නොමැති විටදී, දැඩි ආතතියක් හා කිසිවක් කර ගැනීමට නොහැකි බවක් දැනෙන්නේද? |
| **තමාව පාලනය කර ගැනීමේ අපහසුතාව** (Loss of control ) | |
| 1 | මෙතම්පිටමින් භාවිතයෙන් මිදීමට උත්සාහ කර එය අසාර්ථක වී තිබේද? |
| 2 | දැන් ඔබට මෙතම්පිටමින් භාවිතයෙන් ඉවත්වීමට අවශ්‍යතාවක් පවතීද? |
| 3 | මෙතම්පිටමින් භාවිතයෙන් ඉවත්වීමට ඔබට කිසියම් මිතුරෙකු හෝ පවුලේ සාමාජිකයෙකු උදව් කර තිබේද? |
| 4 | මෙතම්පිටමින් භාවිතයෙන් ඉවත්වීම සඳහා ඔබ කවදා හෝ උපදේශකයෙකුගෙන් උපදෙස් ලබාගෙන තිබේද? |
| **Neglect** | |
| 1 | මෙතම්පිටමින් භාවිතය නිසා ඔබගේ එදිනෙදා කටයුතු (work performance) අතපසු වී හෝ මන්දගාමී වී තිබේද? |
| 2 | මෙතම්පිටමින් නිසා කිසියම් මිතුරෙකු හෝ රැකියාවක් අහිමි වී තිබේද? |
| 3 | මෙතම්පිටමින් නිසා ඔබ කවදා හෝ පවුලේ හෝ වෙනත් පෞද්ගලික වගකීම් නොසළකා හැර තිබේද? |
| 4 | මෙතම්පිටමින් නිසා ඔබ කවදා හෝ නීතිමය කරදරයකට වැටී තිබේද? |
| 5 | මෙතම්පිටමින් භාවිතයට යොමුවීමෙන් පසු සමාජ සම්බන්ධතා හෝ විනෝදාංශ කෙරෙහි අඩු උනන්දුවක් ඇති බව හැඟෙනවාද? |

| | |
|---|---|
| **සෞඛ්‍ය බලපෑම(Compromise of health)** | |
| 1 | මෙතම්පිටමින් භාවිතය නිසා රුධිර පීඩනය, ශ්වසන ආබාධ, අධික ලෙස බර අඩුවීම, දන්ත ගැටලු හෝ ආසාදන වැඩිවී තිබේද? |
| 2 | මෙතම්පිටමින් භාවිත කළ දින සිට අක්මාවේ හානි, පපුවේ වේදනාව, වකුගඩු ආබාධ, රුධිරය කැටිගැසීම්, භාන්තිකාරී හෝ ආතතිකාරී තත්ත්වයන් ඇතිවී තිබේද? |
| 3 | මෙතම්පිටමින් භාවිතය නිසා කවදා හෝ රෝහලට ගොස් තිබේද? |
| 4 | ඔබ මෙතම්පිටමින් භාවිතයෙන් ඉවත්විය යුතු යැයි වෛද්‍ය නිලධාරියෙකු විසින් උපදෙස් දී තිබේද? |
| **භාවිතය (Usage)** | |
| 1 | ඔබ දවසේ සැළකිය යුතු කාලයක් මෙතම්පිටමින් පිළිබඳව හෝ එය ලබා ලැබීමට ක්‍රම සොයමින් සිටින්නේද? |
| 2 | ඔබ දවසේ සැළකිය යුතු කාලයක් මෙතම්පිටමින් භාවිත කිරීමෙන් වන බලපෑම් සමඟ කාලය ගත කරන්නේද? |
| 3 | මෙතම්පිටමින් භාවිත කිරීමෙන් පසු ඔබට දවසේ වෙනත් කටයුතු සඳහා අඩු කාලයක් ඇති බව හැඟෙන්නේද? |
| 4 | ඔබ සතියකට තුන් වතාවකට වඩා මෙතම්පිටමින් භාවිත කරනවාද? |
| 5 | ඔබ මෙතම්පිටමින් භාවිත කිරීමෙන් කිසියම් දිනක අධිමාත්‍රා (Overdose) වී තිබේද? |

(APA, 2019,https://www.rehabs.com/assessments/)